වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ
Professionals' National Front
66/1, Havelock Rd. (Thummulla) Colombo 05
Telephone : 076 6846623
Email : pnflanka@gmail.com

**2023.11.20**

අතිගරු ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ

ගරු ජනාධිපතිතුමනි,

**විදුලිබල මණ්ඩලය රටම බොරුවෙන් වසා ජනතාව පෙළමින් සිදුකළ "විදුලි බිල වැඩි කිරීම" වහාම අත්හිටුවන්න.**

විදුලිබල මණ්ඩලය මේ වන විට ජනතාව භීතියට පත් කරමින් (තම මුදල් මංකොල්ල කන්නාසේ ජනතාවට හැඟෙන පරිදි සිදුකළ) විදුලි බිල ඉහළ නැංවීමේ නිවැරදි තොරතුරු විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ සැබෑ තතු සඟවමින් අසත්‍ය හේතු මත සිදුකළ මෙම විදුලි බිල ඉහළ නැංවීම එක්තරා අයුරෙකින් මංකොල්ලයක් බවය. ලංවිම සහ මහජන උපයෝගීතා කොමිසමේ දත්ත සහ ගණනය කිරීම් මත පදනම්ව පවා අප විසින් සිදුකළ විමර්ෂණයෙන් ඒ තීරණයේ වැරදි සහගත බව මනාව පැහැදිලි වී ඇති අතර මෙම මිල ඉහළ දැමීමට සාධාරණ හේතුවක් නොමැති බවද පැහැදිලි වෙයි. ලංවිම විසින්, ඉල්ලුම අධිතක්සේරු කිරීම සහ කාලගුණ අනාවැකි සාවද්‍ය ලෙස භාවිතයත් අදාළ නොවන හේතූන් යොදාගෙන මෙම මිල ඉහළ දැමීම සිදු කොට ඇත. ඒ පිළිබඳ සම්පූර්ණ වාර්ථාවක් මේ සමග අමුණා තිබෙයි.

තවද අද වන විට පසුගිය ඔක්තෝබර් සහ නොවැම්බර් මුල සති දෙක සඳහා වන නිවැරදි තොරතුරු අප වෙත ලැබී ඇති අතර ඒ අනුව අප සඳහන් කරනු ලබන තොරතුරු සත්‍ය බැව් තවදුරටත් තහවුරු වී තිබේ. මෙහිදී ජල විදුලිය නිපදවීම අඩුවෙන් සිදුවනු ඇති බවට ද, ඉල්ලුම සඳහා කළ අධි තක්සේරුවද බොරු බවට පත්වෙමින් දැවිතෙල් තාප බලාගාර භාවිතයෙන් විදුලිය ජනනය ශුන්‍ය බවට ආසන්න වී, ගල් අඟුරු බලාගාර භාවිතයද අවම වී තිබේ. මේ සෑම වැරදි ගණනයක්ම පාහේ 20 ගුණයක පමණ අගයකින් ඊට අදාළ වියදම වැඩි කරනුයේ එම අමතර තෙල් තාප විදුලි ඒකක, ජල විදුලිය මෙන් 20 ගුණයක් මිල අධික වන බැවිනි. මෙලෙස කරන ලද විදුලි බිල ඉහළ නැංවීම සම්බන්ධව ජනතාව කුපිත වීම ස්වභාවිකය. ඒ බැව් රටේ විධායකයද හොඳින් දන්නා බැව් පැහැදිලිවන්නේ, විදුලි බිල ඔක්තෝබර් මාසයේ සිට වෙනස් කිරීමට සැප්තැම්බර් 25 වනදා කැබිනට් අනුමැතිය හිමිවූ බැව් මහජන උපයෝගීතා කොමිසම පැවසුවත්, අමාත්‍ය මණ්ඩල කායීලයේ කැබිනට් තීරණ දැනුම් දීම් අතර මේතරම් ජනතාවට බලපාන කරුණක් සඳහන් නොවීමෙනි. නමුත් දැන් ඔබතුමා ඇතුළු විධායකයට මෙය නිවැරදි කිරීමට සහ අහිමි වූ ජනතා ප්‍රසාදය දිනා ගැනීමට අවස්ථාව එළඹ තිබේ.

පසුගිය 14 වනදා ඉරිදා දිවයින පුවත්පත වාර්තා කළ පරිදි, ඉන්ධන භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය බිංදුව දක්වා අඩුව තිබූ බව විදුලිබල මණ්ඩලය පිළිගෙන තිබුණි. වෙනත් මූලාශ්‍ර අනුව සඳහන් වූයේ ඔවුන් මීළඟ විදුලිබිල සංශෝධනයේ දී ඒ පිළිබඳව සහනයක් සලසන බවය. එය ඉතා භයානක ක්‍රියාවකි. ලංවිම කටයුතු කරන ආකාරය තුළ දක්නට තිබෙන අමනෝඥම තත්වය නම් ආර්ථික න්‍යායයන් සහ පලවිපාකයන් පිළිබඳ කිසිදු තැකීමක් නොමැති වීමය. ඔවුන් ඇතිවිය හැකි අලාභය ගණනය කිරීම සහ ඒ අනුව මිල ඉහළ නැංවීම කතා කරනු මිස කිසිවිටෙකත් මිල ඉහළ නැංවීමෙන් සිදුවන ඉල්ලුම පහළයාම අනුව ගණනය කිරීම් සිදු කළ බවක් මහජන උපයෝගීතා කොමිසම මගින් ප්‍රකාශිත තොරතුරු අනුව පෙනෙන්නට නැත. ඔවුන්ගේ මේ වැරදි මිල ව්‍යුහය හේතුවෙන් මේ කාර්තුව තුළ 300GWh ප්‍රමාණයක් අඩු පිරිවැයකින් නිපදවා විශාල ලාභයක් හිමි කරගැනීමේ වරම අහෝසි කොටගෙන තිබේ. මෙලෙස **ලංවිමට අහිමිවන ලාභය රුපියල් බිලියන 10කට වැඩිය.** ඒ අතර පවතින තත්ව යටතේ පෙර මිලටම

සැලකුවත් මේ වසරේ **<u>හිමිවීමට නියමිත ලාභය ද රුපියල් බිලියන 10කට වැඩිය.</u>** ප්‍රධාන ජලාශ පිටාරගැලීම් වලින් සිදුවන පාඩුව නොසලකා හැර පරිභෝජනය අඩුවීමෙන් ඉතිරිවන ධාරිතාව ජලාශයන් හි රැස්ව ජනවාරියට ගෙනයාහැකියයි සැලකුවත්, මෙම කාර්තුවේ හිමිවන වාසිය ලංවිම බලාපොරොත්තුවන ලෙස ලබන වර්ෂයේ මුලදී ලබාදීම භයානක වන්නේ, වර්ෂාව අඩු පෙබරවාරි මාර්තුවලදී අඩු මිලට විදුලිය සැපයීමට ගොස් නැවත තෙල් මගින් ජනනය කොට ලංවිම පාඩු ලබා එහි හිලව්වට වැසි කාලයේදී නැවත මිල ඉහළ නංවා ලැබිය හැකි ලාභය අවම කර ගැනීම සහ ජනතාව නැවත පෙළීමට ලක්කිරීමයි. මෙම තකතීරු ක්‍රියාව නැවත සිදු නොවන්නට වග බලාගන්නා ලෙස ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිමු. මේ සඳහා,

- මේ වසර සඳහා සිදු කරන ලද මිල ඉහළ නැංවීම අවලංගු කොට හිඟ මුදල් ජනතාවට ගෙවා, අඩුම තරමේ දෙසැම්බර් මාසය තුළවත් **<u>වැඩි ජල විදුලි ඒකක ප්‍රමාණයක් විකුණා වැඩි ලාභයක් ලැබීමට විධානය කිරීම.</u>**
- ලබන වසර සඳහා ලංවිම ලාභය සහ ජනතා ප්‍රතිලාභය උපරිම වන අයුරෙන් **<u>මිල ප්‍රතිව්‍යුහගත කිරීමට උපදෙස් ලබා දීම.</u>**

මේ රටේ ජනතාවගේ බරපතළ ප්‍රශ්නයක් වන විදුලි බිල, මෙලෙස වහාම අඩුකිරීමට ඇති අවස්ථාව භාවිතයට ගෙන, එම පියවර ගන්නා ලෙසට මහත් ඕනෑකමින් යුතුව ජනතාව වෙනුවෙන් කියා සිටින්නෙමු. ඉහත කාරණා සම්බන්ධව වැඩිදුර තොරතුරු ඕනෑම වෙලාවක ඔබතුමන් වෙත විද්‍යාත්මකව සහ තර්කානුකූලව පැහැදිලිකළ හැකි බව ද අපගේ යෝජනා ඉදිරියේදි අපි අදාළ ආයතනයන් වෙත ලබා දෙන බවද වැඩිදුරටත් අවධාරණය කරන්නෙමු.



**කපිල රේණුක පෙරේරා**
**සභාපති**
**වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ**

පිටපත්:
විදුලිබල හා බලශක්ති අමාත්‍ය
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
ලංකා විදුලිබල මණ්ඩලය
මාධ්‍ය